සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 09 - 2023

## ඉස්ලාම් ධර්මය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

උපදෙස් :-

- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ඉතා නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

### I කොටස

01. ඉස්ලාමීය මහා වගකීම් අතරින් සකාතයට හිමි ස්ථානය කුමක්ද?
   1. 3 වන   2. 2 වන   3. 4 වන   4. 5 වන
02. හජ්හි අර්කාන් හෙවත් ෆර්ලුවල අඩංගු කරුණ මෙයින්
   1. අර්ෆාහි රැඳීම   2. මිනාහි ගල් විසි කිරීම
   3. මුස්දලිපාහි රැඳී සිටීම   4. තල්බියා උසුරීම
03. හදීස් එක් රැස් කිරීමේ කාර්යය ආරම්භ කල කලීෆා
   1. අබුබක්කර් (රලි)   2. උමර් (රලි)
   3. උස්මාන් (රලි)   4. උමර් ඉබ්නු අබ්දුල් අසීස් (රලි)
04. අල්ලාහ් දෙවියනී ඔබ ඔබගේ කරුණාවේ දොරටුව මා හට විවෘත කර දෙනු මැනව" යනුවෙන් ප්‍රාර්ථනා කරන අවස්ථාව මෙයින්,
   1. නිවසට ඇතුල්වන විට   2. මස්ජිදයට පිවිසෙන විට
   3. නිවෙසින් පිටත්ව යන විට   4. මස්ජිදයෙන් පිටත්වන විට
05. කොන්ස්තාන්තිනෝබල් නගරය ජයග්‍රහණය කළ මුස්ලිම් වීරවරයාණන්,
   1. තාරික් බින් සියාද්   2. සලාහුදීන් අය්යූබි   3. මහම්මද් අල් ෆාතිහ්   4. මුහම්මද් බින් කාසිම්
06. 'උම්මුල් මසාකින් යනුවෙන් හැඳින්වූයේ'
   1. මයිමූනා (රලි)   2. සෙයිනබ් බින්ද් ජහ්ෂ් (රලි)
   3. සෙයිනබ් බින්ද් හුසෙයිමා (රලි)   4. අස්මා බින්ත් අබුබක්ර් (රලි)
07. ඉමාම් බුහාරි (රහ්) තුමානන් උපත ලැබූ හිජ්රි වර්ෂය
   1. හිජ්රි - 194   2. හිජ්රි - 150   3. හිජ්රි - 80   4. හිජ්රි - 209
08. ඉස්ලාමය වැළඳ සිටිමින් සහාබාවරුන්ව තමාගේ පියවූ ඇසින් දුටු අය හැඳින් වෙන්නේ,
   1. තාබිඊන්වරුන්   2 තබඋත්තාබිඊන්වරුන්   3 අන්සාරිවරුන්   4 මුහාජිර්වරුන්
09. නබි මූසා (අලෛ) තුමා විවාහවූ කාන්තාවගේ පියාණන්වන්නේ,
   1. සුලෙයිමාන් (අලෛ)   2 ඉබ්රාහීම් (අලෛ)   3 සුඅයිබ් (අලෛ)   4 යූසුප් (අලෛ)
10. "තූර්සිනා" යන කඳ සමඟ සම්බන්ධ වූ නබිවරයාණන්,
   1. සුලෙයිමාන් (අලෛ)   2 ඉබ්රාහීම් (අලෛ)   3 මූසා (අලෛ)   4 යූසුප් (අලෛ)

11. පලමුවෙන්ම මුහම්මද් (සල්) තුමාණන්හට පහළ වූ අල්කුර්ආන් සූරාහි වදන්වල සංඛ්‍යාව

1. සූරා නාස්හි පලමු වදන් පහ
2. සූරා ෆාතිහානී වදන් හත
3. සූරා අලක්හි පලමු වදන් පහ
4. සූරා බකරාහි පලමු වදන් හත

12. අල්කුර්ආනය ගොනු කොට ග්‍රන්ථාරූඨ කිරීමේ කාර්යය සඳහා පවරන ලැබූ සහාබිවරයාවන්නේ

1. හුදෙයිෆතුල් යමානි (රලි)
2. උමර් ඉබ්නු කත්සාබ් (රලි)
3. අබ්දුල්ලාහ් ඉබ්නු උමර් (රලි)
4. සයිද් ඉබ්නු සාබිත් (රලි)

13. මස්ජිදයකට ඇතුල්වූවායින් අනතුරුව කරන්නාවූ සලාතය වන්නේ

1. ඉස්තිහාරා සලාතය
2. ඉස්තිස්කා සලාතය
3. තහියයතුල් මස්ජිද් සලාතය
4. විත්ර් සලාතය

14. අල්ලාහ් තාලාට සුවිශේෂීවූ සුද්ධ නාමයක්වන "අද්ල්" යන්නෙහි අර්ථය වන්නේ

1. පරිපූර්ණවන්තයා
2. ජීවමාණවූවා
3. සම්පූර්ණ දැනුම ලැබුවා
4. නීතිය ක්‍රියාකරන්නා

15. පහත සඳහන් සලාතයන් අතරින් කස්රු, ජම්උ කල නොහැකි සලාතය මෙයින්

1. ඉශා සලාතය
2. මඃරිබ් සලාතය
3. අසර් සලාතය
4. සුබහ් සලාතය

16. සූරා ලුහාහි අඩංගු වදන්වල සංඛ්‍යාව

1. 11
2. 15
3. 19
4. 20

17. "මදීනා ගිවිසුම" පැවැත් වූ නගරය කුමක්ද?

1. මක්කම
2. මදීනාව
3. අකබාව
4. හුදෙයිබියාව

18. හින්දු ආගමිකයින්ගේ පලමු දෙවියා ලෙස සඳහන්වන්නේ

1. බ්‍රහ්මන්
2 පිල්ලෙයාර්
3 සිවන්
4 විෂ්ණු

19. ස්වර්ගයේ නම් වලින් එකක්වන්නේ මෙයින්

1. ජහීම්
2 ජන්නතුල් අද්න්
3 සකර්
4 නාර්

20. "ෂෆාඅතුල් කුබ්රා" යන මහා කන්නලව්ව කිරීමට අවසන් දිනයෙහි අවසරලත් නබිවරයාණන්

1. මූසා (අලෛ)
2 ඊසා (අලෛ)
3 මුහම්මද් (සල්) තුමා
4 ඉබ්‍රාහීම් (අලෛ)

21. නබි (සල්) තුමාණන්ගේ අවසන් හජ්වන්දනාව ඉටුකල හිජ්රි වසර වන්නේ,

1. හිජ්රි - 6
2 හිජ්රි - 5
3 හිජ්රි - 9
4 හිජ්රි - 10

22. හිජ්රි 204 වසරේ හයිසාපූර්හි උපත ලැබූ ඉමාම්වරයාණන්

1. ඉමාම් අබූ දාවුද් (රහ්)
2. ඉමාම් මුස්ලිම් (රහ්)
3. ඉමාම් බුහාරි (රහ්)
4. ඉමාම් තිර්මිදි (රහ්)

23. මුහම්මද් (සල්) තුමාණන් අවසන් වරට විවාහ වූ භාර්යාව වන්නේ,

1. උම්මු හබීබා (රලි)
2. මයිමූනා (රලි)
3. සෙයිනබ් බින්ද් ජහ්ෂ් (රලි)
4. සෙයිනබ් බින්ද් හුසෙයිමා (රලි)

24. මුහම්මද් (සල්) තුමාණන් මත ආදර කිරීම හඳුන්වන්නේ

1. මහබ්බතුල්ලාහි
2. මහබ්බතුර් රසූල්
3. මහබ්බතුස්සුන්හා
4. තාඅතුර් රසූල්

25. යමෙක් ඔටුවන් දහදෙනෙක් සතුව සිටින්නේ නම් ඔහු විසින් සකාත් දිය යුත්තේ,

1. එළුවෙක්
2. එළුවන් දෙදෙනෙක්
3. ඔටුවෙක්
4. ගවයෙක්

• 26 සිට 30 දක්වා ඇති ප්‍රශ්නවලට සුදුසු පදය යොදා හිස්තැන් පුරවන්න.
(තර්හීබුත් තිලාවත්, ඉහ්රාම්, තර්හිබුත් නුසූල්, තච්ර්, කෆන්, හිරා)

26. යම් ජනාසාවක් සඳහා අඳවන සුදු පැහැති වස්ත්‍රය ................................යනුවෙන් හැඳින්වේ.
27. හජ් වන්දනාවේ යෙදෙන්නා ..........................යන වස්ත්‍රය ඇඳ නියයත් තැබිය යුතුය.
28. නබි (සල්) තුමාණන් හිජ්රත් ගමන යන විට ........................... ගුහාවේ දින තුනක් රැඳී සිටියහ.
29. මුහම්මද් (සල්) තුමාණන් හට පලමු වහිය ...................................... යන ගුහාවේදී පහල විය.
30. අල්කුර්ආන් වදන් පාරායන කරන ක්‍රමයවන්නේ ................................යනුවෙන් හැඳින්වේ.

• 31 සිට 35 දක්වා ඇති ප්‍රශ්නවලට නිවැරදි නම් (√) යනුවෙන් ද වැරදි නම් (X) යනුවෙන් ද සඳහන් කරන්න.

31. සහීහ් බුහාරි නම් හදීස් ග්‍රන්ථයේ සඳහන් හදීස්වල සංඛ්‍යාව 7572 ක් වේ. ( )
32. මුස්ලිම් පිරිමින් සේද ඇඳුම් ඇඳීම තහනම් වේ. ( )
33. ඊසා (අලෛ) තුමාණන්ගේ ශිෂ්‍යයින් "හවාරිය්‍යූන්" යන නමින් හැඳින්වූහ. ( )
34. මය්මූනා (රලි) තුමිය අබූ සුෆ්යාන්ගේ දියණිය වේ. ( )
35. අල්කුර්ආන් වැකි පොලොවට පහලවීම සඳහා වසර 23 ක් ගතවිය. ( )

• 36 වන ප්‍රශ්නයේ සිට 40 දක්වා ඇති ප්‍රශ්න සඳහා A කොටසේ සිට B කොටසේ සුදුසු උත්තර සම්බන්ධ කරන්න.

| A | B |
|---|---|
| 36. හජ් පමණක් ඉටු කිරීමට නියයත් තැබීම | මුඃජිසා |
| 37. නබිවරුන්ට ලබා දුන් ප්‍රාතිහාර්යයකි | මුත්තෆකුන් අලයිහි |
| 38. සහීහෛයින් | ඉස්තිඃෆාර් |
| 39. පව්වලට සමාව ඇයදීම | ඉෆ්රාත් |
| 40. ඉතා උසස් ස්වර්ගය | ජන්නතුල්ෆිර්දව්ස් |
| | කිරාත් |
| | කරාමත් |

(ලකුණු 40යි)

II කොටස

පළමුවන ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

01. සියළු ප්‍රශ්නවලට කෙටියෙන් පිලිතුරු සපයන්න.
  1. "ඉක්රඃ" යන්නෙහි අර්ථය කුමක්ද?
  2. "සුනන් අර්බආ" නමින් හඳුන්වන හදීස් ග්‍රන්ථ දෙකක් සඳහන් කරන්න.
  3. "සකාත්" යන අරාබි පදයෙහි අර්ථය කුමක්ද?
  4. ෆිර්අවුන් නම් රජු පාලනය කල රට කුමක්ද?
  5. ජනාබත් ඇතිවූවන් වැලකිය යුතු කාර්යයන් දෙකක් සඳහන් කරන්න.
  6. මස්ජිදෙහි වැදගත් කම පිළිබඳ හදීසයක් සඳහන් කරන්න.

7. හදීස් කලාවෙහි යෙදුණු ඉමාම්වරුන් දෙදෙනෙක් සඳහන් කරන්න.

8. නබි (සල්) තුමාණන් ඉහ්රාම් පැළඳගත් ස්ථානය කුමක්ද?

9. ඊමාන් කලයුතු කරුණු දෙකක් සඳහන් කරන්න.

10. අවසන් දිනය හඳුන්වන නම් දෙකක් සඳහන් කරන්න. ලකුණු (2x10 = 20)

02. i. හජ් ක්‍රියාවන් සමග' සම්බන්ධවූ ස්ථාන දෙකක් සඳහන් කරන්න.

ii. හජ් ෆර්ළු හතරක් සඳහන් කරන්න.

iii. හජ් ඉටුකිරීමෙන් ලැබෙන ප්‍රයෝජනයන් දෙකක් සඳහන් කරන්න. ලකුණු (2+4+4 = 10)

03. i. ෆිර්අවුන්ගේ මාළිගාවේ හැදුණු නබිවරයාණන් සඳහන් කරන්න.

ii. මූසා (අලෛ) තුමාණන්හට අල්ලාහ් විසින් ලබා දෙන ලද ප්‍රාතිහාර දෙකක් සඳහන් කරන්න

iii. නබි ඊසා (අලෛ) පිළිබඳව කරුණු හතරක් සඳහන් කරන්න. ලකුණු (2+4+4 = 10)

04. i. "උම්මහාතුල් මුඃමිනීන්" යන්නෙහි අර්ථය කුමක් ද?

ii. "උම්මහාතුල් මුඃමිනීන්"වරුන් හතර දෙනෙකුගේ නම් සඳහන් කරන්න.

iii. නබි (සල්) තුමාණන් උම්මු හබීබා (රලි) තුමිය විවාහ කර ගැනීම සම්බන්ධ වූ සිද්ධිය කෙටියෙන් සඳහන් කරන්න.

ලකුණු (2+4+4 = 10)

05. i. යම් මුස්ලිම් ජනාසාවක් වෙනුවෙන් ඉටුකලයුතු යුතුකම් දෙකක් සඳහක් කරන්න.

ii. යම් ජනාසා සලාතයක් ඉටු කරන විට තක්බීර් අතර පාරායන කල යුතු කරුණු සඳහන් කරන්න.

iii. සකාත්වලින් ලැබෙන ප්‍රයෝජන හතරක් සඳහන් කරන්න.

ලකුණු (2+4+4 = 10)

06. i. ඉස්ලාමීය ඉතිහාසයේ ප්‍රසංසනීය විරුවන් දෙදෙනෙකුගේ නම් සඳහන් කරන්න.

ii. සමාජ සංහිඳියාව, සහජීවනය ඇති කරන්නාවූ කරුණු හතරක් සඳහන් කරන්න.

iii. ආහාර වශයෙන් ගැනීමට අල්ලාහ් විසින් තහනම් කරන ලද ආහාර හතරක් සඳහන් කරන්න.

ලකුණු (2+4+4 = 10)

සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 09 - 2023

## ඉස්ලාම් ධර්මය - පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | |
|---|---|---|---|---|
| 01. 1 | 06. 3 | 11. 3 | 16. 1 | 21. 4 |
| 02. 1 | 07. 1 | 12. 4 | 17. 2 | 22. 2 |
| 03. 4 | 08. 1 | 13. 3 | 18. 2 | 23. 2 |
| 04. 2 | 09. 3 | 14. 4 | 19. 2 | 24. 2 |
| 05. 3 | 10. 3 | 15. 4 | 20. 3 | 25. 2 |

26. කෆන් 27. ඉහ්රාම් 28. හිරා 29. සබ්ර් 30. තර්තීබ් තිලාවත්

31. X 32. √ 33. √ 34. X 35. √

36. හජ් පමණක් ඉටු කිරීමට නියයත් තැබීම (ඉෆ්රාත්)

37. නබිවරුන්ට ලබාදෙන ලද ප්‍රාතිහාර (මුඃජිසා)

38. සහීහෙයින් (මුත්තෆකුන් අලෙයිහි)

39. පව් සඳහා සමාව අයදීම (ඉස්තිඃෆාර්)

40. ඉතා උසස් ස්වර්ගය (ජන්නතුල් ෆිර්දව්ස්) (ලකුණු 40)

### II කොටස

01. 1. කියවන්න
 2. සුනන් ඉබ්නු මාජා, සුනන් නසාඉ, සුනන් තිර්මිදි.
 3. පිරිසිදුකම/ දියුණුව/සංවර්ධනය/යහපැවැත්ම
 4. ඊජිප්තුව
 5. සලාතය ඉටු කිරීම/ මස්ජිදයේ රැඳී සිටීම/කඃබාව තවාෆ් කිරීම/ අල්කුර්ආනය පාරායනය කිරීම/ ඇල්ලීම/රැගෙනයාම
 6. "කවරෙකුගේ සිත මස්ජිදය සමඟ ඉතා කිට්ටුවෙන් සම්බන්ධවී තිබේද ඔහු අවසන් දිනයේදී අර්ෂ්හි සෙවෙනෙහි සිටී"
 7. ඉමාම් බුහාරි (රහ්)/මුස්ලිම් (රහ්)/ අබූ දාවුද් (රහ්)
 ඉබ්නු මාජා (රහ්) / තිර්මිදි (රහ්)/හසර් (රහ්)
 8. දුල් හුලෙයිෆා
 9. අල්ලාහ්/අවසන් දිනය/නබිවරුන්/දේව ග්‍රන්ථ/මලක්වරන්/කලා කද්ර්
 10. යව්මුල් බඃස්/ යව්මුල් කියාමා/යව් මුල් හිසාබ්/යව්මුල් ආකිරා/යව්මුද්දීන් (ලකුණු 2x10 = 20)

(6) WWW.PastPapers.WiKi (5)
Download Term Test Papers, Short Notes From One Place!

02. 1. කඃබා/ සෆා/ මර්වා/ මිනා/ මුස්දලිෆා/අරෆා

2. නියයත් තැබීම/ අරෆාහි රැඳී සිටීම/ තවාෆුල්ඉෆාලා ඉටු කිරීම/ සඃයු කිරීම/ හිසකෙස් ඉවත් කිරීම/ පිළිවෙලට ඉටු කිරීම

3. සහෝදරත්වය/සමානත්වය/සමගිය/අත්හැරීම/ඉවසීම/ එකට ජීවත් වීම/මරණින් මතු ජීවිතය ගැන සිතීම.

(ලකුණු 2+4+4 = 10)

03. 1. නබි මූසා (අලෛ)

2. හැර මිටිය නයෙක්ව වෙනස්වීම/අත් දිලිසීම

3. මර්යම් (අලෛ) තුමියගේ පුතා

පියකු නොමැතිව අල්ලාහ්ගේ ප්‍රාතිහාර්යයෙන් ඉපදීම

ඊස්රායීල් ජාතිකයින්ට නබිවරයෙක්සේ යවන ලදී

ඉන්ජීල් දේව ග්‍රන්ථය ලැබීම

නොයෙක් ප්‍රාතිහාර පෙන්නුම් කිරීම වැනි කරුණු සඳහන් කර තිබීම. (ලකුණු 2+4+4 = 10)

04. 1. මුඃමින්වරුන්ගේ මව්වරුන්

2. සෙයිනබ් බින්ද් ජහ්ශ් (රලි)/සෙයිනබ් බින්ද් හුසෙයිමා (රලි)/ උම්මු හබීබා (රලි) මයිමූනා (රලි) වැනි අය

3. උම්මු හබීබාගේ මුල් නම රම්ලා වේ.

තමාගේ ස්වාමියා සමග ඉස්ලාමය වැළඳ ගනිමින් අබිසී නියාවෙහි ජීවත් වූහ.

ස්වාමියා කිතුනු දහමට යෑමෙන් අනතුරුව වැන්දඹු කාන්තාවක්සේ ජීවත්වීම.

නබි (සල්) තුමා ඇගේ තොරතුරු දැන ගනිමින් නජ්ජාශි රජුගේ අනුමැතියෙන් පසු ඇය විවාහ කර ගැනීම.

(ලකුණු 2+4+4 = 10)

05. 1. ස්නානය කරවීම/ කෆන් කිරීම / සලාතය ඉටු කිරීම / භූමදාන කිරීම

2. සූරා ෆාති හා පාරායන කිරීම/ නබි (සල්) මත සලවාත් ඉසිලීම / ජනාසාව වෙනුවෙන් දුආ ප්‍රාර්ථනා කිරීම/සලාම් කිරීම

3. ආර්ථික වෙනස්කම් නොමැකි යෑම/ ධනය සංවර්ධනය වේ. දුගී දුප්පත්කම නැතිවීයාම/ බරකත් ඇතිවීම/ අවසන් දිනයේ ගැලවීම ලැබේ/ ආදරය, කරුනාව ඇතිවී වෛරය නැතිවේ.

(ලකුණු 2+4+4 = 10)

06. 1. සලාහුදීන් අය්යුබි/මුහම්මද් අල් ෆාතිහ්

2. සෑම මිනිසෙක්ම ආදම්ගෙන් පැවති සමාජය බව බැලීම/ අසල්වැසියන් සමග සමගියෙන් හැසිරීම/වැරදිවලට සමාකිරීම/පොදු වැඩ සටහන්වලට සහභාගිවීම/ ආපදා තත්ත්වයන්හි උපකාර කිරීම/ ප්‍රාදේශිය/ ජාතික සත්කාරවලට දායකවීම/ සහජීවනය/ සංහිඳියාව සඳහන් රුස්වීම්/ සාකච්චාවලට සහභාගී වීම.

මෙවැනි කරුණු හතරක් සඳහන් කර ඇත්නම් ලකුණු හතරක් ලබා දෙන්න.

3. ඌරු මස්/ලේ/මැරුණු සතුන්/ මත් ද්‍රව්‍ය/ ශරීරයට හා ජීවිතයට හානි කරන දෑ.

මෙවැනි කරුණු 04ක් සඳහන් කර ඇත්නම් ලකුණු 04ක් ලබා දෙන්න.

(ලකුණු 2+4+4 = 10)

PAST PAPERS WIKI

(6) WWW.PastPapers.WiKi (6)



Download Term Test Papers, Short Notes From One Place!

LOL.lk
**BookStore**

# විභාග ඉලක්ක
# පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**